## විසර්ජන ශීර්ෂය 133 - තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය.

## විගණකාධිපති වාර්තාව - 2012 වර්ෂය

### 1.1 විගණන විෂය පථය

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 අගෝස්තු 15 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙනයාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 1.3 විගණන නිරීක්ෂණ

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ආ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.7 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ). විසර්ජන ගිණුම

------------------

මුළු ප්‍රතිපාදනය හා වියදම

------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා අමාත්‍යාංශය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.3,189,301,486 ක් වූ අතර, වර්ෂය අවසාන වනවිට ඉන් රු.2,182,739,450 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ඉතිරිවීම් රු.1,006,562,036 ක් වී තිබුණු අතර, එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 31.56 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2012 දෙසැම්බර් 31 දිනට ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| පුනරාවර්තන | 1,149,000,000 | 1,149,000,000 | 91,234,757 | 7.9 |
| මූලධන | 2,027,000,000 | 2,040,301,486 | 915,327,279 | 44.86 |
| එකතුව | 3,176,000,000 | 3,189,301,486 | 1,006,562,036 | |

(ආ) <u>අයවැය විචලනය.</u>

(i) වැය විෂයයන් 07 ක් සඳහා සළසා තිබුණු රු.25,650,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ii) වැය විෂයයන් 87 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 05 ත් සියයට 99 ත් අතර පරාසයක් ගෙන තිබුණි.

## 1.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය.

### 1.4.1 සංයුක්ත සැලැස්ම

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් ඉදිරි වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් අමාත්‍යාංශය විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළයුතු වුවත්, 2012-2014 කාලසීමාව සඳහා 2012 සැප්තැම්බර් මස සකස් කරන ලද සංයුක්ත සැලැස්මෙහි කෙටුම්පත 2013 ජුනි මස විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි.

## 1.5 කළමනාකරණ අකාර්යක්ෂමතා.

මොනරාගල, බුත්තල පැවැත්වූ "දැයට කිරුළ" ජාතික සංවර්ධන ප්‍රදර්ශනයේ කුටි නිර්මාණය සඳහා යොදා ගන්නා ලද රු.2,797,000 ක් වටිනා ලී හා යකඩ වැනි අමුද්‍රව්‍ය ඒවායේ සැපයුම්කරුටම ඉවත් කර ගැනීමට ඉඩ සළසා තිබීම හා එම පිරිවැයෙන් යම්කිසි ප්‍රතිශතයක් හෝ තක්සේරු වටිනාකමක් අය කිරීමට අදාළව ගිවිසුමේ වගන්තියක් ඇතුළත් නොකිරීම නිසා රජයට ලබාගත හැකිව තිබූ ආදායමක් අහිමි වූ බව නිරීක්ෂණය විය.

## 1.6 වත්කම් කළමනාකරණය

### වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය.

(අ) මු.රෙ.756 සහ 507(1) ප්‍රකාරව අමාත්‍යාංශය යටතේ පවතින විදාතා මධ්‍යස්ථාන 260 න් 50 ක වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය කර නොතිබුණි.

(ආ) භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව මාධ්‍ය අංශයේ ද්‍රව්‍ය 28 ක් සඳහා ලෙජරය අනුව හා තථ්‍ය ශේෂය එකම අගයක් ගත්තද, තථ්‍ය ශේෂයම එම ද්‍රව්‍යවල අතිරික්තයක් ලෙස සමීක්ෂණ මණ්ඩලය විසින් සාවද්‍ය ලෙස දක්වා තිබුණි.

(ඇ) පහත සඳහන් භාණ්ඩවල ඌණතාවයක් දක්නට ලද නමුත් සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව ඒවා ඌනතාවයන් ලෙස දක්වා නොතිබුණි.

| අංශය | ද්‍රව්‍ය | ඌනතාවය |
|---|---|---|
| අමාත්‍ය කාර්යාලය | කබඩ් | 01 |
| | දුරකථන | 02 |
| | ප්ලාස්ටික් පුටු | 10 |

1.7 මානව සම්පත් කළමනාකරණය

අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව.

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 23 | 14 | 09 |
| තෘතියික මට්ටම | 04 | 04 | - |
| ද්විතියික මට්ටම | 770 | 688 | 82 |
| ප්‍රාථමික මට්ටම | 232 | 229 | 03 |
| | 1,029 | 935 | 94 |

සමාලෝචිත වර්ෂය අවසාන වනවිට පුරප්පාඩු 94 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.